**2024 වර්ෂය සඳහා සංවර්ධන නිලධාරි සේවයේ**
**අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල රැස්වීම - 2023.11.03**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන්ගේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල රැස්වීම 2023.11.03 දින පෙ.ව. 11.30 ට භාණ්ඩාගාර නව ගොඩනැගිල්ලේ 4 වන මහලේදී පහත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

**ස්ථාන මාරු මණ්ඩලය :**

**ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය** - සභාපති
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

**අනුරාධා ගල්ලන්ගොඩ මිය** - සාමාජික
නියෝජ්‍ය අධ්‍යක්ෂ

02. සංවර්ධන නිලධාරි සේවා වෘත්තීය සමිති නියෝජිතයන් සහභාගී වූයේ නැත.

03. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරි එම්.ලීලානි මිය විසින් වයස අවු. 57ට ආසන්නවීම මත කඩිනමින් රේගු දෙපාර්තමේන්තුව වෙත යාමට සහ ආනයන හා අපනයන පාලන දෙපාර්තරමේන්තුවේ සේවයේ නියුතු ඒ.ඩී.පී.ද අල්විස් මිය විශ්‍රාම යාමට පෙර රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලමින් අභියාචනා ඉදිරිපත්කොට ඇත. එම අභියාචනා පිළිබඳව සලකාබැලිය නොහැකි බවත්, 10.2 පදනම යටතේ නිලධාරීන් වෙත ලබාදී ඇති වරප්‍රසාදය ඔවුන් මෙම අමාත්‍යාංශයට පැමිණි දිනය අනුව හා මෙම අමාත්‍යාංශයේ සපුරා ඇති සේවා කාලය අනුව හිමිවන බවත් අභියාචනා මණ්ඩලය විසින් දන්වන ලදී.

04. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරි එච්.ඒ.අයි.අබේවර්ධන මිය විසින් ස්ථාන මාරු ඉල්ලා ඇති දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වශයෙන් නිවැරදි විය යුතු බවට සහ ජාතික ඇයවැය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරි ඩී.සී.එස්.කේ.දසනායක මහතා විසින් ඉල්ලා ඇති ස්ථාන මාරු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව ලෙස සංශෝධනය කර දෙන ලෙසටත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් අභියාචනා ඉදිරිපත් කර ඇත. ඒ සඳහා අභියාචනා මණ්ඩලයේ එකඟතාවය ලබාදෙන ලදී.

| | | |
|---|---|---|
| ............................ | ............................ | ............................ |
| **ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය**<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්<br>(සභාපති)<br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | **අනුරාධා ගල්ලන්ගොඩ මිය**<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>(සාමාජික)<br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | **එන්.ටී. අමරතුංග මිය**<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>(සාමාජික)<br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |

**2024 වර්ෂය සඳහා කාර්යාල සේවක සේවයේ**

**අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල රැස්වීම - 2023.11.03**

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ගේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල රැස්වීම 2023.11.03 දින පෙ.ව. 11.00 ට භාණ්ඩාගාර නව ගොඩනැගිල්ලේ 4 වන මහලේදී පහත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

**ස්ථාන මාරු මණ්ඩලය :**

**ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය** - සහාපති
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

**අනුරාධා ගල්ලන්ගොඩ මිය** - සාමාජික
නියෝජ්‍ය අධ්‍යක්ෂ

**වෘත්තීය සමිති නියෝජිතයින් :**

I. කේ.ඩී.ප්‍රේමදාස මහතා - භාණ්ඩාගාරික
රජයේ කාර්යාල සේවක සේවා සංගමය

02. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙහි සේවයේ නියුතු කා.සේ.සේ. I - ටී.එම්.විජේතිලක මයා රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලබාදෙන ලෙස අභියාචනයක් ඉදිරිපත් කර ඇත. ඔහු 2024.10.27 දින රේගුව වෙත ස්ථාන මාරු ලැබීමට නියමිතය.

03. තවද පහත නම් සඳහන් නිලධාරීන් විසින් වයස අවු. 55 සම්පූර්ණ කිරීම මත කඩිනමින් රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුකරන ලෙස දන්වමින් අභියාචනා ඉදිරිපත්කොට ඇත. එම අභියාචනා පිළිබඳව සලකාබැලිය නොහැකි බවත්, 10.2 පදනම යටතේ ඔවුන් වෙත ලබාදී ඇති වරප්‍රසාදය ඔවුන් මෙම අමාත්‍යාංශයට පැමිණි දිනය අනුව හා මෙම අමාත්‍යාංශයේ සපුරා ඇති සේවා කාලය අනුව හිමිවන බවත් අභියාචනා මණ්ඩලය විසින් දන්වන ලදී.

1. පී.ඩී.සමන් මංගල මයා - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
2. බී.කේ.සුනිල් ශාන්ත මයා - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| ......................................... | ......................................... | ......................................... |
| **ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය** | **අනුරාධා ගල්ලන්ගොඩ මිය** | **එන්.ටී. අමරතුංග මිය** |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | නියෝජ්‍ය අධ්‍යක්ෂ | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| (සහාපති) | (සාමාජික) | (සාමාජික) |
| මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ |
| ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |